## මාර්ග නඩත්තු භාර අරමුදල - 2011

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට මාර්ග නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

භාර ඔප්පුවේ 11 වගන්තිය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ අප්‍රේල් අවසන් දින හෝ එදිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 ජුනි 21 දිනදීය.

1.2.2 **විගණන නිරීක්ෂණ**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** භාර ඔප්පුවේ 04 වගන්තියට අනුව භාරයේ ප්‍රධාන අරමුණ වන්නේ, මාර්ග ජාලයේ සිදුවන පිරිහීම වළක්වාලීම සඳහා ජාතික මාර්ගවල සාමාන්‍ය හා කාලීන නඩත්තු වැඩ සටහන් සඳහා කාලීන ආකාරයෙන් මූල්‍යයනය කිරීමයි. කෙසේවෙතත්, භාර අරමුදලේ කළමනාකරණය විසින් ඔවුන්ගේ ඉහත වගකීම් ඉටුවන ආකාරයට කටයුතු සිදුකර නොතිබුණි.

**(ආ)** භාර ඔප්පුවේ 19 වගන්තියට අනුව තිරසාර මාර්ග නඩත්තු මූල්‍යයනය සැපයීමේදී භාරයේ කාර්යක්ෂමතාවය තක්සේරු කිරීමට හා භාරයේ මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ මාර්ගයන් පරීක්ෂා කිරීම සඳහා භාරය ආරම්භ කර වර්ෂ 3 කට පසු සමාලෝචනයක් සිදුකළ යුතුය. 2006 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි භාරය මෙහෙයුම් කටයුතු සිදුකර ඇතත්, අවශ්‍ය පරිදි භාර අරමුදලේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය භාර අරමුදල් කළමනාකරණ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.

(ඈ) භාර ඔප්පුවේ 20 වගන්තියට අනුව, භාරයේ අරමුණු ඉටුකිරීම අපහසුවන අවස්ථාවලදී භාරය ඇවර කළ යුතු අතර භාරයේ සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මාරු කල යුතුය. විගණනයට ඉදිරිපත් කල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මූල්‍ය හා භෞතික මෙහෙයුම් සිදුකර නොතිබූ අතර භාර මණ්ඩලය විසින් භාර ඔප්පුවේ ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලව ක්‍රියාකර නොතිබුණි.

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාර අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,481,215 ක ශුද්ධ අතිරික්තයක් විය.

සමාලෝචිත වර්ෂයේ ලැබීම්, ගෙවීම් හා ශුද්ධ අතිරික්තය පහත සාරාංශයෙන් පෙන්නුම් කෙරේ.

| | 2011<br>රු. මිලියන |
|---|---|
| භාණ්ඩාගාරයෙන් ලැබීම් | නැත |
| මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් | නැත |
| එකතු කළා : භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | 3.5 |
| ශුද්ධ අතිරික්තය | 3.5 |